ඔබම දැනුවත් කිරීම අපගේ යුතුකමකි
+61 3 9792 9977 info@warnalegal.com




**<u>මාගේ මව හා පියාට දැනට තුන් අවුරුදු සංචාරක වීසා ලැබී ඇත. නමුත් ඔවුන් මාස 12 ක් ඕස්ට්‍රේලියාවේ ගත කල පසු මාස 6ක් ලංකාවේ සිටිය යුතුය. එය වීසා කොන්දේසියකි. මාගේ දෙවන දරුවා ලැබීමට ආසන්න බැවින් මෙම කොන්දේසිය වෙනස් කරවා ගත නොහැකිද?</u>**

1. **<u>මා ජාත්‍යන්තර ශිෂ්‍යයකු ලෙස (International Student) ඕස්ට්‍රේලියාවේ අධ්‍යාපන කටයුතු සඳහා පැමිණියෙමි. මා ලගකදී විවාහ වූ බැවින් මාගේ බිරිඳව ඕස්ට්‍රේලියාවට රැගෙන ඒමේ හැකියාව කෙසේද?</u>**

**Sudath - Springvale –Victoria**

ඔබට පහසුවෙන් ඔබේ බිරිඳව ගෙන්වා ගත හැකිය. ඒ සඳහා ශිෂ්‍ය වීසා යටතේ බිරිඳට අයදුම් පතක් ගොනුකර ඇයගේ යැපීම් සඳහා ප්‍රතිපාදන පෙන්විය යුතුය.

2. **<u>මම නිතර වෙනත් රටවලට සංචාරය කරමි.යම් ඇමරිකානු සංචාරක ආයතනයක් මගින්, මා හට ඇමරිකානු ඩොලර් 250,000 ක ලොතරැයියක් ඇදී ඇති බව පවසා, එම මුදල් ත්‍යාගය මා හට ලබා දීමට නම් මුලින් Au$ 3000/= ගාස්තු මුදලක් විද්‍යුත් තැපෑල හරහා ඉල්ලා සිටී. මා මෙය ගෙවිය යුතුද?</u>**

**Jeson-Vctoria**

විද්‍යුත් තැපැල් (email) හරහා බෝහෝ වංචා සිදුවන බැවින්, ඔබ ඒ සඳහා අවදියෙන් සිටීම වැදගත්ය. අදාල ආයතනයේ නිවැරදි විද්‍යුත් තැපෑලට මෙම කාරණය ඉදිරිපත් කර ත්‍යාගය සත්‍යදැයි පළමුවෙන් පසක් කර ගන්න.

3. **<u>මාගේ මව හා පියාට දැනට තුන් අවුරුදු සංචාරක වීසා ලැබී ඇත. නමුත් ඔවුන් මාස 12 ක් ඕස්ට්‍රේලියාවේ ගත කල පසු මාස 6ක් ලංකාවේ සිටිය යුතුය. එය වීසා කොන්දේසියකි. මාගේ දෙවන දරුවා ලැබීමට ආසන්න බැවින් මෙම කොන්දේසිය වෙනස් කරවා ගත නොහැකිද?</u>**

**Priyanthi-Adelaide**

ඔබ හට මෙම ඉල්ලීම ඕස්ට්‍රේලියානු රජයෙන් කල හැකිය.වීසා කොන්දේසි වෙනස් කිරීම සඳහා අයදුම්පත් ගොනු කිරීමෙන් ඔබට මෙය සිදු කර ගත හැකිය.

4. **<u>මා සහ මාගේ බිරිඳ ඕස්ට්‍රේලියානු පුරවැසියන්ය. අපට ශ්‍රී ලංකාවේ ද්විත්ව පුරවැසිභාවය ඇත. අපට යම් දීර්ඝ කාලයක් ලංකාවේ ගත කිරීමට කැමැත්ත ඇති බැවින්, අප අවුරුදු පතා කරන බදු ගණනය කිරීම් වලට (Yearly Tax Lodgements) මෙය කෙසේ බලපාන්නේද?</u>**

**Akila- Hoppers Crossing**

ඔබ ඕස්ට්‍රේලියාවේ පුරවැසියකු වන බැවින්, අවුරුදු පතා කරන බදු ගණනය කිරීම් වල වගකීමට ඔබ බැඳී සිටී. ඔබ එතෙර සිටියද මෙම වගකිම පැහැර හැරිය නොහැක. එබැවින්, බදු ඒජන්තවරයෙකු ( Tax Agent) යටතේ ලියාපදිංචි වී එම නීතිමය අවශ්‍යතාවය අවුරුදු පතා සැපිරීමට වග බලා ගන්න.

5. **<u>මාගේ නම ඉතා දීර්ඝය. මෙය ඕස්ට්‍රේලියාවේ විවිධ හැඳුනුම්පත් වල වෙනස් ආකාරයෙන් සහ යම් යම් කොටස් අඩුවෙන් සටහන්ව ඇත. නීතිමය අවශ්‍යතා වලදී විවිධ හැඳුනුම්පත් වල නම් යම් ආකාරයකින් වෙනස් බැවින් මා අසීරුතා රැසකට මුහුණ දෙමි. මෙම ගැටලුව මග හරවා ගන්නේ කෙසේද?</u>**

**Rangika – Brisbane**

ඔබගේ විවිධ වශයෙන් සඳහන්ව ඇති නම් කීපයෙන්ම එක් පුද්ගලයෙක් වන ඔබව නියෝජනය වන බව දිවුරුම් ප්‍රකාශයකින් ඔබම ප්‍රකාශ කර එම දිවුරුම් ප්‍රකාශය අවශ්‍ය අවස්ථා වලදී ඉදිරිපත් කිරීමෙන් ඔබට මෙම ගැටලුව තාවකාලිකව මග හරවා ගත හැකිය. තවත් විසඳුමක් ලෙස ඔබ කැමති ලෙස නම වෙනස් කර (කෙටි කර) ඒ සදහා පුද්ගල උපත්, විවාහ හා මරණ රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි කර සහතිකයක් ලබා ගෙන ( Name Change Certificate) ඒ අනුව ඔබගේ සියලුම අනන්‍යතා හැඳුනුම්පත් වෙනස් කිරීමෙන් ඔබට මෙම ගැටළුවට සදාකාලික විසඳුමක් ලබා ගත හැකිය.

WARNALEGAL
Justice for all
නීති උපකාර | சட்ட சேவைகள் | Legal Services
Need Legal Help? Call us Now

- FAMILY LAW
- AUSTRALIAN LEGAL ADVICE
- MIGRATION LAW
- SRI LANKAN LEGAL ADVICE
- CONVEYANCING
- COMMERCIAL & BUSINESS LAW
- LITIGATION
- POWERS OF ATTORNEY & WILLS
- ENGLISH/SINHALESE TRANSLATION & INTERPRETING SERVICE
- SRI LANKAN DEEDS AND COMPANY REGISTRATION SERVICE



Madhu Warnakulasuriya *LL.B*
*Solicitor and Barrister*
*Registered Migration Agent*
*(MARN 1068979)*
*Attorney at Law in Sri Lanka*

03 9792 9977

Sri Lanka:
01 Angampitiya Waikkala Sri Lanka
Hotline – 0776 120 008
031 22 72223 031 22 72223
warnalegal2@gmail.com
warnalegal2

Australia:
1/44 King Street
Dandenong VIC 3175
0432 480 133
+61 3 9792 9977
+61 3 9701 3718
info@warnalegal.com
warnalegal1
www.warnalegal.com